260

තණමල්විල ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ සිය දිවි නසා ගැනීම පිළිබඳව
සමාජ විද්‍යාත්මක විග්‍රහයක්

තිශ්ශංක ජානකී මෙන්ඩිස්

SOCI/R/29/98-2000

සමාජ විද්‍යාපති උපාධිය සම්පූර්ණ කරන
පිණිස කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශය
වෙත ඉදිරිපත් කරනු ලබන
පර්යේෂණ වාර්තාවයි.

කැළණිය විශ්ව විද්‍යාලය සමාජ විද්‍යා අංශය

ශ්‍රී ලංකාව

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 260 |
| වර්ග අංකය | |

# නිබන්ධන සාරාංශය


ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම අද සමාජයේ සාර්ව මට්ටමේ ඇති සමාජ ප්‍රශ්නයකි. එහෙයින් එක් ප්‍රදේශයකට සීමා වීමෙන් සියදිවි නසා ගැනීමේ ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට ප්‍රමාණවත් නොවුවත්, සියදිවි නසා ගැනීමේ හේතු සම්බන්ධයේදී සාර්ව වශයෙන් පවතින ප්‍රධාන ගැටළු ඉවහල් වී ඇති බව පෙනී යයි. එහෙයින් අධ්‍යනය සඳහා යොදාගත් තණමල්විල ආශ්‍රයෙන් "ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම පිළිබඳව සමාජ විද්‍යාත්මක විග්‍රහයක්" යන තේමාව පර්යේෂණයට කේන්ද්‍ර කර ගතිමි. ඒ සඳහා සියදිවි නසා ගැනීමේ දත්ත හා සිද්ධි විග්‍රහය වැදගත් විය. එසේම සමස්ථ සමාජයේ පවතින සංස්ථාගත සම්බන්ධතාවයන්ගේ බිඳ වැටීම සියදිවි නසා ගැනීම කෙරෙහි ඍණාත්මක ලෙස බලපා ඇති බව අධ්‍යනයේ සොයාගත් කරුණු අනුව පෙනීයයි. එහෙයින් සමාජ ව්‍යුහයේ පවතින බිඳුනු සමාජ රටාව සියදිවි නසා ගැනීම සඳහා වැඩි දායකත්වයක් දී ඇති බව පෙනී ගියේය.

ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීමේ වැඩි ප්‍රවනතාවයක් ඇති දිස්ත්‍රික්ක අතර මොණරාගල දිස්ත්‍රික්කය ඉදිරියෙනි. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රදේශය ප්‍රධාන විය. මෙම ප්‍රදේශයන්හි උක්ත කරුණු සම්බන්ධව දක්වන දායකත්වය මැනීමට අධ්‍යනය සඳහා යොදාගත් ක්‍රම වේදයන් ලෙස ක්ෂේත්‍ර අධ්‍යනය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, ප්‍රශ්නාවලි ක්‍රමය ප්‍රධාන විය. ඊට ප්‍රථම පොලිස් වාර්තා මූලාශ්‍ර සහ තණමල්විල ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ දත්තයන් ඉතා වැදගත් විය. තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සියදිවි නසා ගැනීමේ දත්තයන් සමඟ සමාජ ව්‍යුහය සසඳන කළ සමාජය තුළ ගොඩ නැඟී ඇති පවුල් රටාවේ ස්වභාවය සහ ප්‍රධාන ආයතනගත සම්බන්ධතාවයද "සියදිවි නසා ගැනීමේ" ස්වභාවයන්ට ඉඩ ප්‍රස්ථා සලසා ඇති බව පෙනී ගියේය.

මෙහිදී විශේෂයෙන් වැදගත් වන්නේ මෙකී ප්‍රදේශයන්හි ජනපදකරණයට ලක්වූ ප්‍රදේශ සියදිවි නසා ගැනීම සඳහා වැඩි ප්‍රවනතාවයක් ඇති බවයි. අධ්‍යනයේදී ජනපද පරිසර රටාව විමර්ශනය කිරීම වැදගත් විය. එහිදී තහවුරු වූන කාරණා අතර සමස්ථ සමාජ පද්ධතියේ බිඳ වැටීම විශේෂයෙන් පවුල් සංස්ථාව, ආගමික සංස්ථාව, අධ්‍යාපන සංස්ථාව සහ දේශපාලන සංස්ථාව ඉතාමත් දැඩි ලෙස මෙකී ප්‍රදේශයන්හි ජනතාවගේ ජීවිතයට බලපා ඇති බව වැටහුණි.

එහෙයින්, අධ්‍යනයේදී යෙදුනු සීමාවන්හි අවබෝධ වූ කාරණා අතර සමාජ පද්ධතියේ ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බව නිගමනය කළ හැකිය. අද දැඩි සමාජ ප්‍රශ්නයක් ලෙස පවතින

ශ්‍රී ලංකාවේ සියදිවි නසා ගැනීම අවම කර ගැනීම මේ තුළින් අපේක්ෂා කළ හැකිය. එසේම ගොඩ නැඟී ඇති දුබල පෞරුෂ මට්ටම දියුණු කිරීමත්, පුද්ගල විභවතාවයන් වර්ධනය කිරීම සඳහා සමාජ සැලසුම් සංවිධානය කිරීමද අවශ්‍ය බවද තහවුරු විය.

22-11-2003